# 5. නබිතුමාණන්ගේ යහගුණ

නබි තුමාණෝ යහපත් ගතිගුණවලින් යුක්ත වූහ. කුඩා කාලයේ සිට ඇත්ත කතා කළහ. විශ්වාසවන්තයකු ලෙස ජීවත් වූහ. අන් අයට උපකාර කළහ. අන් අයගේ දුකේ දීත් සැපේ දීත් ඔවුන් සමග සිටියහ. දුප්පතුන්ට අනුකම්පා කළහ. අනාථයන්ටත්, වැන්දඹුවන්ටත් උදවු කළහ. ඥාතීන්ට ආදරය දැක්වූහ. සාධාරණ ව ජීවත්වූහ. යහපත් ක්‍රියාවල යෙදුණහ. අයහපත් ක්‍රියාවලින් වැළකී සිටියහ.

## පැවරුම්

**පහත සඳහන් වචනවලින් සුදුසු වචන යොදා අභ්‍යාස පොතේ ලියන්න.**

**උදවු, යහපත්, ආදරය, විශ්වාසයෙන්, අනුකම්පා**

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ හැම විට ම ................. වැඩවල යෙදුණහ. අනාථයන්ට සහ වැන්දඹුවන්ට ................ කළහ. ඥාතීන්ට ..................... කළහ. සැම කෙනකු සමග ම ................ ජීවත් වූහ. දුප්පතුන්ට ................... කළහ.



4. රජයේ මු.ස. - 120277